## 01.1 හැඳින්වීම

"මිනිසාට රසවිඳියහැකි සුන්දරම අත්දැකීම වන්නේ විශ්වයේ ඇති ගුප්ත බවයි"

ඇල්බට් අයින්ස්ටයින්

ගුප්ත බව මෙන්ම ඒ හා බැඳුණු සංකීර්ණ මනෝභාවයන් විඳ ගැනීමටත්, වඩා ගැඹුරු සිතුවිලි ධාරාවක කිමිදීමටත් වඩා ප්‍රශස්තම මඟ සිනමාවයි. විශ්වීය ප්‍රවණතාවයන් සමග ඒකාත්මික වී සොයා සපයාගන්නා රූපාන්තරයන් සිනමාවේදී ප්‍රස්තුතයන් බවට පත්වේ. මෙතරම්ම සියුම්ව ජීවිතය සමඟ බැඳෙන සිනමාව ප්‍රකාශනාත්මක මාධ්‍යයක් වශයෙන් ආරම්භ වී සියවසක් වැනි කාලසීමාවක දී මෙතරම් ස්ථාවරත්වයකට පත්වන්නේ මෙකී රූප මාධ්‍යයෙහි සංගෘහිත වූ යථාර්ථවත් අනුභූතීන් නිසාවෙනි. ජාති, ආගම්, දේශාන්තරයන් සීමාතික්‍රමණය කරමින් ව්‍යාප්තවගිය සිනමාව ඒ ඒ ජාතියට, දේශයට, සංස්කෘතියට අනන්‍ය වූ ලක්‍ෂණවලින් ඉතා ඉක්මණින් ආඩ්‍යය විය. එනම්, සමාජ විපරිකාරකයින් සමඟ මනාව බැඳෙමින් සුන්දර මෙන්ම ජීවිතාවබෝධය කැටිකොටගත් යථාර්ථවත් දැක්මක් සහිත නව සිනමා ආගමනයක් වශයෙන් ඉරාන සිනමාව හැඳින්විය හැකිය.

ඉතා දැඩි නීති රීති පද්ධතියක් සහිත ඉස්ලාම් ආගමික පරිසරයත්, දේශ සීමා අර්බුද, ආගමික කොටස් අතර ඇතිවන නිරන්තර ගැටීම් වලින් පීඩා විඳින ඉරානයේදී සිනමාව පිළිබඳ වාර්තා හමුවන්නේ 1896 දීය. චලන චිත්‍රයේ ආරම්භයත් සමඟම එහි පහස විඳ ගැනීමට ඉරානයට හැකි වුවත් පළමු වරට ඉරාන වෘතාන්ත සිනමාව පිළිබඳ වාර්තා හමුවන්නේ 1930 දීය. එය ආර්මේනියානු ජාතිකයෙක් වූ Ovanese Oganians විසින් නිර්මාණය කළ Abi and Rabi නමැති චිත්‍රපටය වේ. නමුත් සිනමාව නමැති මාධ්‍යය ආරම්භ වූ ප්‍රාථමික අවධියේදී එහි ප්‍රායෝගික අත්දැකීම් ලැබුවත්, කලාත්මකව ජීවිත සමඟ ගැටෙමින් එහි ගැඹුරු තැන් සිනමාවට නැගීම ආරම්භ කරන්නේ ඉරාන නව රැල්ලේ සිනමාකරුවන් සමඟය. ඉරාන සිනමාව තරම් රට අභ්‍යන්තරයෙහි වන දේශපාලන, ආගමික, සංස්කෘතික ගතිකයන් සමඟ අනුරූප වූ සිනමා මාධ්‍යයක් නොමැති තරම්ය. ඉරානයේ ඉතා පැහැදිලිව දේශපාලනමය විපර්යාසයන් කිහිපයක් පසුගිය ශතවර්ෂය තුළදී සිදුවිය. 1920 න් ඇරඹෙන බටහිරගැති Shah පාලනය, එම පාලන ව්‍යුහය උඩු යටිකුරු කරමින් 1979 දී සංස්කෘතිකමය විප්ලවයකින් රාජ්‍යත්වයට පත් වූ අයතුල්ලා කුමේනිගේ වකවානුවත්ය. නමුත් 1990 න් පසුව ඇතිවන දේශපාලන නව්‍යකරණය ඉතා දැඩි ආගමික නීති රීති වලින් හෙම්බත්ව සිටි කාන්තාවන්, කලාකරුවන් ප්‍රමුඛ සමස්ථ ඉරානුවන්ටම සන්සුන්ව තම ජීවිතවලට ප්‍රවිෂ්ඨ වීමේ භාග්‍ය උදාවිය. මෙම සමාජ, දේශපාලන පෙරළිය ඉරාන සිනමාවට කෙතරම් දුරට සාර්ථක ලෙස බලපෑවේද යන්න අද වන විට ඉරාන සිනමාව ලබාඇති අද්විතීය ජයග්‍රහණ දෙස බැලූවිට මනාව පැහැදිලිවේ.

1990 දී Darioush Mehrjui ගේ The Cow නමැති චිත්‍රපටය සමඟ ඉරාන නව රැල්ලේ සිනමාව ආරම්භවිය. මෙතෙක් කල් ඉරානය පුරා ව්‍යාප්තව පැවති අර්ථ ශූන්‍ය වූ දේශීය චිත්‍රපටත්, විනෝදාශ්වාදය පදනම් කරගත් බොලිවුඩ්, ජර්මන්, ඊජිප්තු වැනි සිනමා පට වලටත් මේ

නිසා දැඩි පහරක් එල්ල විය. මෙතෙක් කල් අවධානය යොමු නොකළ බොහෝ සාමාජීය ගැටලු පිළිබඳව තම නිර්මාණකරණය මෙහෙය වූහ. නමුත් ඉරාන සිනමාකරුවන්ගේ මෙම නව පිබිදීම පවා ඉතා සීමාකාරී වපසරියක රැඳී තිබුණි. දැඩිව හික්මවනු ලැබූ ආගමික පරිසරයේදී කලාකරුවන්ට තම ප්‍රකාශනයේ විවෘතභාවය තවදුරටත් ගැටලුවක් විය.

ඉරාන කලාකරුවෝ තමා සංවේදී වූ මනුෂ්‍යත්වය සම්බන්ධයෙන් ගැඹුරු ආලෝචනයක් ජනිත කිරීමට මානව දයාව උතුරායන හරවත් අනුභූතීන් සම්ප්‍රේෂණය කිරීමට තමාට අනන්‍ය වූ ආඛ්‍යානයන් සොයා යන්නේ මේ නිසාය. ඉතා දැඩිව නෛතිකමය වශයෙන් ස්ථාපිත කොට ඇති ආගමික සමාජයේදී ඔවුන්ගේ ප්‍රකාශනයේ විප්ලවීය අනුගත වීම වශයෙන් මෙය පෙන්වාදිය හැකිය. අද ඉරාන සිනමාව යනු ලොව පැවැත්වෙන සෑම සිනමා උළෙලකම, සිනමාව සම්බන්ධ සෑම වාර ප්‍රකාශනයකදීම මාතෘකාවට ලක්වන ප්‍රපංචයක් වී අවසන්ය.

Dariush Mehrjui, Abbas Kiarostami, Jafar Panahi, Mohsen Makmalbaf, Majid Majidi වැනි පශ්චාත් විප්ලවවාදී සිනමාකරුවෝ යථාර්ථය දෙස වැඩි අවධානයක් යොමු කරමින් නිර්මාණකරණයේ යෙදුනහ. බොහෝදුරට ඔවුන්ගේ තේමාවන්ගෙන් බහුතරය ඉස්ලාමීය සමාජයේදී ගැරහුම් ලබමින් සිටින තම ස්ත්‍රිය දෙසට යොමු විය. කාලයාගේ ඇවෑමෙන් සමාජ ආකල්පයන් පරිවර්ථනය කොටගත් මෙම කලාකරුවන්ගේ අත්දැකීම් හා ජීවිතය සම්බන්ධ පරිණත දෘෂ්ටිය ඔවුන්ගේ කලා කෘතීන් කෙරෙන් වහනය විය. චිත්‍රපටවලදී ඔවුන් නිරූපණය කළ කාන්තාව මෙතෙක් ඉරාන සිනමාවෙ හමුවූ කාන්තාවට වඩා බෙහෙවින්ම වෙනස් විය. ගැහැණිය ඉතා ශක්තිමත්ව සිනමාවට සම්බන්ධ කර ගෙන ඇත. Dariush Mehrjui ගේ Sara – 1993, Pari – 1955, Leila – 1996, Santouri – 2007, Mohsen Makmalbaf ගේ The Actor – 1992, Time of Love – 1990, Gabbeh – 1995, Khandahar – 2001, Sex and Pholosophy වැනි චිත්‍රපට ඉරාන අධ්‍යක්ෂකවරුන් කාන්තාව දෙස ධනාත්මකව තම පරිකල්පනය මෙහෙය වූ අවස්ථාවන්ය. ඉරාන අධ්‍යක්ෂකවරුන්ගේ මෙම මානුෂීය දෘශ්ටිය ඉරානයේ නව කාන්තා සිනමාවක් ස්ථාපිත වීම කෙරේ බෙහෙවින්ම බලපෑම්කළ සාධනයක් වශයෙන් පෙන්වාදිය හැකිය. අන්ධකාරයෙන් පැන නැගි රිදී රේඛාවක් මෙන් ඉරාන සිනමාව මේ තරම් විශේෂ වන්නේ සිනමා කෘතිවල සන්ධර්භය ඉතා සරළ එකක් මෙන් බාහිරින් අර්ථකථන ලබාදිය හැකිය. නමුත් දෘෂ්ටි ගෝචරවන යථාර්ථය ඉක්මවා ගොස් මනෝවෘතීන් හා බැඳි සමාජ කතිකාවතක් මේ තුළ අන්තර්ගතවේ. විශේෂයෙන්ම සිනමා කර්මාන්තයේ බලධරයන් වන හොලිවුඩ්, බොලිවුඩ් කෘතිවල දක්නට ලැබෙන සිහින ලෝකවල රසිකයන් අතරමං කරවන ඒකාකාරී බවින් මිදුණු යථාර්ථවත් දක්මක් මේ සිනමා කෘතිවල අන්තර්ගත වේ. වාණිජ්‍යත්වයෙන් ආත්මාර්ථකාමී නොවී ජීවිතය මිනිසුන් සමඟ බෙදා හදා ගත් පොදු සම්මුතිගත බවත් ඉරාන සිනමාව මෙතරම් ජාත්‍යන්තර කීර්තියට පත්වන්නට හේතුවිය හැකිය.